# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2156/15 - 2019 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2019.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති විෂයයන්ගේ පහත කාර්යයන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයාට පවරන බව මෙයින් සඳහන් කරමි.

ඩලස් අලහප්පෙරුම,
අධ්‍යාපන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 31 වැනි දින,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**පළමුවන උපලේඛනය**

**අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව පාසල් පෙළපොත්, නිල ඇඳුම්, දිවා ආහාර, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.<br>2. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම හා ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටු වන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම.<br>3. වතු පාසල් හා දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 1. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>2. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය.<br>3. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.<br>4. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය.<br>5. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව. | • පාසල් සංවර්ධන මණ්ඩල පනත (1993 අංක 08)<br>• රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24) |

*පළමුවන උපලේඛනය (සම්බන්ධිතයි)*

**අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 4. ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ පළාත් සභා පාසල්, ජාත්‍යන්තර පාසල්, පෞද්ගලික පාසල්වල අධ්‍යාපන හා ශිෂ්‍ය සුභ සාධන, ප්‍රවාහන, සනීපාරක්ෂක කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය. | | |
| 5. සියලු පාසල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පන්ති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් හා පරිසර හිතකාමී පාසල් සංවර්ධනය ජාතික පාසල්වල මෙන්ම පළාත් සභා පාසල්වලට අයත් පාසල්වල ද පොදු ප්‍රමිතියක් යටතේ දියුණු කිරීම. | | |
| 6. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | | |
| 7. දැනට ඇති හෝමාගම සහ මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය යන පාසල් දෙකට අමතරව දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකටම අවම වශයෙන් ''තෛභාෂිත, අග්‍රගණ්‍ය සුපිරි ජාතික පාසලක්'' බැගින් හිමි වන ලෙස ද්විතියික ආදර්ශ පාසල් 20 ක් පළමු වසර දෙක තුළදී ආරම්භ කිරීමට කටයුතු කිරීම. | | |
| 8. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | | |
| 9. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය. | | |
| 10. ශිෂ්‍ය සුභසාධන වැඩපිළිවෙලක් ලෙස පාසල් සිසුන්ට ලබා දෙන රක්ෂණ ක්‍රමය පිළිබඳ කටයුතු. | | |
| 11. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක ලෙස කටයුතු කිරීම. | | |

අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය සිදුකරමින් ඉහත කාර්යයන් හා කර්තව්‍යය ඉටු කිරීම.

01 - 454

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.